# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date – 2025.01.05 පැය 1045 | දුරකථන අංකය Tel.NO – 011-2887973 | මගේ අංකය My NO – D/Media/Out 21 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails – dir.media@police.gov.lk


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2025.01.04 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 06 | 06 | 156 | - | තඹ දඟර 02<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2025.01.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තඹුත්තේගම පොලිස් වසමේ යාය 04 ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 10 ග්‍රෑම් 325 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තඹුත්තේගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන රාජාංගනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තඹුත්තේගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණෙ කඳවුර.**

2025.01.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණෙ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එරගම පොලිස් වසමේ නවනගරය මාර්ගයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25 මිලි ග්‍රෑම් 440 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන එරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන එරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එරගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2025.01.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගම්පහ පොලිස් වසමේ කොටුගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 160 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2025.01.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඔකේවෙල පොලිස් වසමේ වතුමුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඔකේවෙල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන වතුමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඔකේවෙල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. ගංජා වගා කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2025.01.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හම්බේගමුව පොලිස් වසමේ දළුක්ගල ප්‍රදේශයේදී වැටලීම් දෙකක් සිදු කර පර්චස් 50 ක් පමණ වගාකර තිබූ ගංජා හේන් දෙකක් වටලා ගංජා ගස් 7750 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හම්බේගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන වතුමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හම්බේගමුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**